ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1920ක්වූ ජූලි මස 19වෙනි සඳුදින අ. භා. 1ක් කනිසමට යාපනේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඔනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1920ක්වූ ජූනි මස 18වෙනි
දින යාපනේ කච්චේරියේදීය.

බී. කොන්ස්ටන්ටයින්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—උතුරු දිසාවේ ගොයිතැන් අත්සඳුබැලීමට ස්ථානයක් සහ එම පාඨශාලාවක් විවෘතකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කර තිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් තිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම නො. 5,191. ගම්—නැගෙණහිර කොක්කුවිල් සහ බස්නාහිර තිරුනල්වෙලි.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 13 | කුලවාපුරම් .. | දූන්කලවත්ත .. | කේ. සින්නතම්බි තිරුනන්වෙලි .. .. | 0 0 27·12 |
| 14 | එම .. | එම් .. | තිරුනන්වෙලි පදිංචි වී. සුබ්‍රමනියම්ගේ වැන්දඹු පාරුපදිපිල්ලේ සහ කොක්කුවිල පදිංචි ඇම්. වීරවාගුගේ ස්ත්‍රී වල්ලිපිල්ලේ | 1 3 0·37 |
| 15 | කුලවප්පුලම් .. | එම .. | කොක්කුවිල පදිංචි ඇස්. සින්නතුරේ .. .. | 1 1 37·50 |
| 16 | එම .. | එම .. | තිරුනල්වෙලි පදිංචි වී. සුබ්‍රමනියම්ගේ වැන්දඹු පාරුපදිපිල්ලේ | 1 1 25·87 |
| 17 | එම .. | එම .. | තිරුනල්වෙලි පදිංචි වී. කන්දසියා .. .. | 0 2 38·25 |
| 18 | එම .. | එම .. | තිරුනල්වෙලි පදිංචි කේ. කාසිපිල්ලේ ඔහුගේ අතබාල දරුවන් වෙනුවට | 0 0 33·37 |
| 19 | එම .. | එම .. | එම .. .. .. | 0 2 17 |
| 20 | එම .. | එම .. | තිරුනල්වෙලි පදිංචි ඇස්. කාර්තිකේසුගේ ස්ත්‍රී සිවකාමිපිල්ලේ .. | 0 0 29·12 |
| 21 | එම .. | එම .. | ඇම්. තම්බිපිල්ලේගේ ස්ත්‍රී සින්නපිල්ලේ .. .. | 0 1 33·25 |
| 22 | එම .. | එම .. | තිරුනල්වෙලි පදිංචි සුප්පර් කාර්තිකේසුගේ ස්ත්‍රී සිවකාමිපිල්ලේ සහ කේ වෙල්ප්පාගේ ස්ත්‍රී අන්නම්මා | 0 2 13·62 |
| 23 | එම .. | එම .. | (1) වී. කනගරත්නම්ගේ ස්ත්‍රී තිල්ලේපිල්ලේ, (2) ඇස්. කාර්තිකේසුගේ ආරක්ෂාව යටතේ සිටින සී. අරුනාචලම්ගේ අතබාල දරුවන්, (3) ඇස්. කාර්තිකේසු, (4) ඇම්. තම්බිපිල්ලේ තිරුනල්වෙලි පදිංචි | 2 0 0 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින්දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1920ක්වූ ජූලි මස 20වෙනි අඟහරුවාදා අ. භා. 1ක් කනිසමට ජාපනේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඔනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1920ක්වූ ජූනි මස 18වෙනි
දින ජාපනේ කච්චේරියේදීය.

බී. කොන්ස්ටන්ටයින්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පැල්මඩුල්ලේ දිස්ත්‍රික් ඉංජිනේරු මහත්මයාගේ පදිංචියට බන්ගලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරය කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් තිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 34. ගම—පනාවැන්න, නවදුන්කෝරලේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 101A | මාවරකුඹුරේගොඩහේන .. | ලන්ද .. | ගබ්බෙලබඩල්ගේ රන්නසිඳෙ .. | 4 2 13 |
| 101B | එම .. | රබර් .. | පැල්මඩුල්ලේ රබර් සමාගම .. | 0 0 5 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1920ක්වූ ජූලි මස 20වෙනි දින පෙරවරු 10යේ කනිසමට පැල්මඩුල්ලේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඔනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1920ක්වූ ජූනි මස 19වෙනි
දින රත්නපුර කච්චේරියේදීය.

ජී. ඇෆ්ජ්. ආර්. බ්‍රවුනිං,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ඇම්ටියගොඩ ස්වභාෂා පිරිමි පාඨශාලාවට සහ පාඨශාලාවත්තටත් ගැණීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 2,914. ගම—ඇම්වීයගොඩ, අටකලන්කෝරලේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | ඇත්වත්තෙහේන නොහොත් මීගහ තැන්නෙහේන | පොල්වත්ත .. | විකිරිබන්ඩා විජේරත්න .. | 0 2 8·1 |
| 3 | ඇත්වත්තෙහේන නොහොත් මීගහ තැන්නෙහේනෙවත්ත | එම .. | එම .. .. | 0 2 0 |

එබැවින් ඉඩම් අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙනබව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1920ක්වූ ජූලි මස 20වෙනි දින පස්වරු 3නේ කනිසමට මාදම්පෙ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1920ක්වූ ජූනි මස 19වෙනි දින රත්නපුරේ කච්චේරියේදීය.

ජී. ඇfජ්. ආර්. බ්‍රවුනින්,
සබරගමුවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පල්ලෙකන්දේ ස්වභාෂා ගැණු පාඨශාලා වත්ත ලොකුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 2,976. ගම—පල්ලෙකන්ද, මැදකෝරලේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කටුකැන්දකැටියේහේන .. | පොල්වත්ත .. | කේ. ඇම්. තේගිස් අප්පුහාමි .. | 0 1 0·2 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1920ක්වූ ජූලි මස 19වෙනි දින පස්වරු 2කේ කනිසමට බලන්ගොඩ සර්කිට් බංගලාවේදී මා ඉදිරිපිටටපැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙමඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත්ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1920ක්වූ ජූනි මස 19වෙනි දින රත්නපුරේ කච්චේරියේදීය.

ජී. ඇfජ්. ආර්. බ්‍රවුනින්,
සබරගමුවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—රක්වානේ ගම්සභා බන්ගලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 2,968. ගම—රක්වානේ සනීපාරක්ෂක නගර සීමාව තුල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | නාරන්ගහකුඹුරේගොඩහේන .. | ලන්ද .. | මැදගන්ගොඩගේ දිස්නබබා .. | 0 1 26·3 |
| 2 | එම .. | එම .. | දෙනිකි ගාබ්‍රියෙල් මාර්ටින් .. | 0 2 3·4 |
| 3 | එම .. | එම .. | ඒ. ඇfජ්. මොලමූරේ හිටපු රටේමහත්මයා .. | 0 0 22 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙනබව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1920ක්වූ ජූලි මස 21වෙනි දින පෙරවරු 10ගේ කනිසමට රක්වානේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1920ක්වූ ජූනි මස 19වෙනි දින රත්නපුරේ කච්චේරියේදීය.

ජී. ඇfජ්. ආර්. බ්‍රවුනිං,
සබරගමුවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[කුරුණෑගල දැන්වීම නො. 7,557.]

වර්‍ෂ 1920ක්වූ ජූනි මස 25වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී එච්. සී. ටොලර් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එයි ඉඩමට හෝ එහි කොටසකට අයිතිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

එච්. සී. ටොලර්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩමට උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කෙක් දඹදෙනිහත්පත්තුවේ නැගෙණහිර උඩුකහකෝරලේ ලෙව්දයිය යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනීයන 422කේ ලංකාමැනීමේ මුල් සිතියමේ 6Aත් පෙනෙණ අක්කර [illegible]කුත් පර්චස් 31ක් බිම්තරම ඇති සාමාන්‍ය වශයෙන් කොටුගොඩයාලාගේහේන කියන නොහොත් ඒ නමින් දැනගන තිබෙන බිම්කට්ටියට මායිම් :—උතුරට ආණ්ඩුව විසින් විකුණපු අස්වැද්දුමේහේන්යාය, (303,384රේ පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම) හෙවිපික්ක් ගද්ඇලද; නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුණනලද වෙල්පල්ලවද, (303,386 පිඹුරුකඩදාසියේ පෙනෙණ ඉඩම); දකුණට ආණ්ඩුව විසින් විකුණපු කෝන්ගහමුලහේනද, (308,2?8 පිඹුරුකඩදාසියේ පෙනෙණ ඉඩමද); බස්නාහිරට ගියගන්හේනඇලද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 886වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුනෑගල වි. ම. 33—1920.]

---

[කුරුණෑගල දැන්වීම නො. 7,558.]

වර්‍ෂ 1920ක්වූ ජූනි මස 25වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී එච්. සී. ටොලර් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එයි ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

එච්. සී. ටොලර්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩමට උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කෙක් දඹදෙනිහත්පත්තුවේ නැගෙණහිර උඩුකරකෝරලේ අන්දරගපොන යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනීයන 436 ලංකාමැනීමේ මුල් සිතියමේ 94ත් පෙනෙණ රූඩ් 1කුත් පර්චස් 33ක් බිම්තරම ඇති සාමාන්‍ය වශයෙන් පන්සලවත්ත කියන නොහොත් ඒ නමින් දැනගන තිබෙන බිම්කට්ටියට මායිම් :—උතුරට හිත්තරපොල පන්සල විසින් අයිතිකම්කියන පන්සලවත්තද, ඩබ්ලිව්. ඇම්. කළුහාමි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම් කියන ගලගාවාවත්තද ; නැගෙණහිරට 299,905 පිඹුරුකඩදාසියේ පෙනෙණ ඉඩම (කොස්වත්ත), රජසන්තක දම්ගොල්ලද; දකුණට හිත්තරපොල යන ගමේ ගම්ඉමද; බස්නාහිරට හිත්තරපොල යන ගමේ ගම්ඉමද, හිත්තරපොල පන්සල විසින් අයිතිකම්කියන පන්සලවත්තද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 886වෙනි පිටේ ප්ලෑනය බලනු,

[කුරුනෑගල වි. ම. 34—1920.]

---

[රත්නපුර දැන්වීම නො. 7,559.]

වර්‍ෂ 1920ක්වූ ජූනි මස 25වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවළුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට, පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇම්. ඊ. ආර්චිබෝල්ඩ් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සැම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇම්. ඊ. ආර්චිබෝල්ඩ්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම. ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

### ඉඩම්වල තොරතුරු.

සබරගමුව දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කෙක් මැදකෝරළේ හෙලපල්ලේපත්තුවේ උතුරු හුනුවල යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

ලංකාමැනීමේ මුල් සිතියම 200A.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 1 | දියපාර .. .. | 0 | 0 | 9 |
| 2 | හුනුවල්පැලිය, කනමැදිරියන්කැපිගේ මූකලාන, හුනුවල්මූකලාන සහ ගල්ලෙනකන්දේවත්ත .. | 2,821 | 0 | 38 |
| 3 | මහවැල්ල (ඇලෙන් කොටසක්) .. | 0 | 0 | 12 |
| 5 | කුඹුරේඇලෙන් කොටසක් (දියපාර) .. | 0 | 0 | 11 |
| 6 | කිරින්දේඇලෙන් කොටසක් (එම) .. | 4 | 2 | 37 |
| 7 | ඉදිරිම්නිකැලේ (කොඩිගහ තිබෙන ඉඩමට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය) | 0 | 1 | 2 |
| 8 | දියපාර .. .. | 0 | 0 | 9 |
| 10 | ඉදිරිම්නිකන්දේඅරඹ .. | 1 | 1 | 4 |
| 11 | අරඹේඇල (දියපාර) .. | 0 | 0 | 35 |
| 12 | ගන්ඉමේ දෙලෙන් කොටසක් .. | 0 | 1 | 33 |
| 13 | රදළදෙලෙන් කොටසක් .. | 0 | 0 | 14 |
| 14 | අලන්කාරපංගුවේමූකලාන (කොඩිගහ තිබෙන ඉඩමට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය) .. .. | 0 | 0 | 25 |
| | | 2,828 | 2 | 29 |

මීට මායිම්—උතුරට නවදුන්කෝරළේ උඩපත්තුවද (බම්බරකොටුව යන ගමේ ගම්ඉමද) හෙලඋඩපත්තුවද (මස්සැන්න යන ගමේ ගම්ඉම); නැගෙණහිරට ඔපනායකේ යන ගමේ ගම්ඉමද; දකුණට උතුරු හුනුවල යන ගමේ ගම්ඉමද; බස්නාහිරට නවදුන්කෝරළේ උඩපත්තුවද (දෙනවක උඩකඩවාරිගම සහ කට්ටාපිටිය යන ගම්වල ගම්ඉම).

ඉහතකී මායිම්වලට මැදිවූ මෙහි පහත දක්වන බිම්කට්ටි මේ දැන්වීමෙන් මේ කොටසෙන් අත්හැරිය වගත් ඒවායේ මුළු බිම්තරමවන අක්කර 7කුත් පර්චස් 16ය ඉහතකී අක්කර 2,828කුත් රූඩ්ස් 2කුත් පර්චස් 29මේ බිම්තරමේ අඩංගු නොවෙන වගත් මෙයින් දැනගත යුතුයි.

ලංකා මැනීමේ මුල් සිතියම 200A.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 4 .. | පිරිහිල්ලේවත්ත සහ ගල්ලෙනකන්ද .. .. .. | 0 | 1 | 29 |
| 9 .. | ඉදිරිමින්කන්දේඅරඹ (279,619 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම) .. .. | 6 | 2 | 27 |
| | | 7 | 0 | 16 |

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 888—889වෙනි පිටුවල ප්ලෑන් බලනු.

[රත්නපුර වී. ම. 6—1920.]

---

[මාතර දැන්වීම නො. 7,560.]

### වර්‍ෂ 1897තේ, 1899යේ, 1900 සහ 1903තේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණත් ප්‍රකාර දැනුම්දීම.

මෙහි පහත සඳහන්වෙන ඉඩම සහ එහි තිබෙන පාරවල් සම්බන්ධ අයිතිවාසිකම් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වර්‍ෂ 1920ක්වූ ජූනි මස 25වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මාතර කච්චේරියේදී මාතර පලාතේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට තමන්ගේ අයිතිකම පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේට වර්‍ෂ 1897 තේ, 1899යේ 1900යේ සහ 1903තේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන තබාපු ලියවිල්ලකින් එළිදරව් කරණවා ඇත.

ජේ. ඩී. බ්‍රවුන්,
ආණ්ඩුවේ උප ඒජන්ත තැන.

### ඉඩමේ තොරතුරු.

දකුණු දිසාවේ මාතර දිස්ත්‍රික්කේ මොරවක්කෝරළේ බින්ගමුව යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනී යන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

ලංකාමැනීමේ සිතියම 18.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 61A1 .. | තිත්තලහේනේකොරටුව (පාරට ඇරපුහරිය) .. .. .. | 0 | 0 | 2 |

මීට මායිම්—උතුරට ආණ්ඩුවට අයිති අඩිපාරට ඇරපු හරියද; නැගෙණහිරට අඩිපාරද; දකුණට ආණ්ඩුවට අයිති තිත්වලහේනද; බස්නාහිරට නොම්මර 329,862කේ පිඹුරකඩදාසියේ පේන ඉඩමද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 887වෙනි පිටේ ප්ලෑනය බලනු.

---

[ඌව දැන්වීම නො. 7,561.]

### වර්‍ෂ 1897තේ, 1899යේ, 1900යේ සහ 1903යේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණත් ප්‍රකාර දැනුම්දීම.

මෙහි පහත සඳහන්වෙන ඉඩම සම්බන්ධව අයිතිවාසිකමක් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වර්‍ෂ 1920ක්වූ ජූනි මස 25වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත බදුල්ල කච්චේරියට ඇවිත් ඌව දිසාවේ ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙණීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට හෝ එයින් එකෙකට තිබෙන අයිතිකම නොහොත් ඒ සම්බන්ධව තිබෙන වැදගත්කම කියා නොසිටියොත් එකී ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් ඉහතකී ආඥාපණත්වලින් උන්නාන්සේට ලැබී තිබෙන බලපූළුවන්කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියානොසිටිය ඒ ඉඩම් හෝ ඉඩම රජසන්තක ඉඩමක් බව උන්නාන්සේගේ අත්සන ලියවිල්ලකින් එළිදරව් කරණ බව මෙයින් දැනගත යුතුයි.

ඩබ්ලිව්. ඇල්. කින්ඩර්ස්ලි,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

කියන්නේ මේ ඉඩම ගැණයි.

ඌව දිසාවේ බදුර් පලාතේ වැල්ලවායේ ඝන්දපල්ලකෝරළේ රත්නත්ගුවාවේගම පිහිටි බිබිලේ අරාව නොහොත් අළුත්ගෙදර මූකලාන කියන අක්කර 1ක් සහ පර්චස් 1ක් වපසරිය ඇති නොම්මර 2,056 මුල් සිතියමේ නොම්මර 1කේ බිම් කට්ටියමෙන් පෙන්නා සිටින මෙහි පහත සඳහන් සිතියමේ පෙනෙන ඉඩම, මීට මායිම්—උතුරට අප්පුහාමි සහ අනිකුත් අය අයිතිවාසිකම්කියන පාළුවත්තේහේන, මලකදුර සහ ආණ්ඩුව අයිතිවාසිකියන වරාපිටියේහේන; නැගෙණහිරට 2,056 මුල් සිතියමේ නොම්මර 3නේ ආණ්ඩුව අයිතිවාසිකියන අළුත්ගෙදරවත්ත නොහොත් බිබිලේඅරාවේ වත්ත; දකුණට බිබිලේ අරාවේ ඇල, කුඹුරුවල සිට වත්තට යන අඩිපාර සහ බිබිලේ අරාව නොහොත් අළුත්ගෙදර මූකලාන; බස්නාහිරට අප්පුහාමි අයිතිවාසිකියන පාළුවත්ත.

එකී ගම පිහිටි බිබිලේ අරාව නොහොත් අළුත්ගෙදර මූකලාන කියන රූඩ් 1ක් සහ පර්චස් 8ක් වපසරිය ඇති නොම්මර 2,056 මුල් සිතියමේ නොම්මර 2කේ බිම්කට්ටිය, මීට මායිම්; උතුරට නොම්මර 2,056 මුල් සිතියමේ නොම්මර 1කේ ආණ්ඩුව අයිතිවාසිකියන බිබිලේ අරාව නොහොත් අළුත්ගෙදර මූකලාන; නැගෙනහිරට නොම්මර 2,056 මුල් සිතියමේ නොම්මර 3නේ ආණ්ඩුව අයිතිවාසිකියන අළුත්ගෙදරවත්ත නොහොත් බිබිලේ අරාවේ වත්ත සහ අප්පුහාමි අයිතිවාසිකියන ගලගාවා ගෙදරවත්ත; දකුණට පූස්වැල්ආර; බස්නාහිරට කදුර සහ අප්පුහාමි අයිතිවාසිකියන පාළුවත්ත.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 890වෙනි පිටේ ප්ලෑනය බලනු.

---

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධ වෂී 1912යේ අඩක 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

මෙහි පහත දක්වන අරක්කු රේන්ද වෂී 1920ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් 1921ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා මාස දොළහකට මිලටගැනීම පිණිස ඉල්ලා එවන ටැන්ඩර්ස් නම් ඉල්ළුම් කඩදාසි කඩා කල්පනාකිරීම පිණිස වැඩබලන ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් පත්කරනලද සභාවක් මෙහි පහත සඳහන්වන දවස්වලදී මන්ත්‍රණසභා ශාලාවෙහි රැස්වන බව මෙයින් එළිදරව්කරනු ලැබේ.

1920ක්වූ ජූලි මස 9වෙනි සිකුරාදා.

| | | | | |
|---|---|---|---|---|
| 1. | සබරගමු පළාත | .. | .. | කෝරළතුන සහ පාතබුලත්ගම |
| 2. | එම | .. | .. | කෑගල්ල දිස්ත්‍රික්කේ හතරකෝරළය |

2. එක එක ඉල්ළුම්කාරයා විසින් තමන් ගෙවන්ට ලෑස්තිව සිටින මුදල් ගණන ඔහුගේ ඉල්ලුම්පත්‍රයෙහි අකුරෙන් සහ ඉලක්කමින් සටහන්කළ යුතුයි.

3. නියමකළ දවසේ පස්වරු 12.30න් පසු ටැන්ඩර් භාරගනු නොලැබේ.

4. ඉහළින් පෙන්වා තිබෙන ලෙස ඒ ඒ රේන්ද දෙකට වෙන වෙන ඉල්ලුම්පත්‍ර ඔප්පුකළ යුතුයි. නම සහ රේන්දේ නොම්මරය ඉල්ලුම්පත්‍රයෙහි සටහන්කළ යුතුයි.

5. ඉල්ලුම්පත්‍ර නිසියාකාර මුද්‍රකර "අරක්කු රේන්ද ටැන්ඩර්" යනු ලකුණුකොට "වංශාධිපති බී. හෝර්ස්බරෝ වැඩබලන මහලේකම්තුමා වෙතටය" යනු පිට ලියා තැපෑලෙන් එවිය යුතුයි, නොහොත් ඉල්ලුම්කාරයා විසින්ම ගෙනවිත් සභාවට භාරදිය යුතුයි.

6. අන්තිම වතාවේ රේන්ද වික්කාට පසු විකුණුම් කොන්දේසි අමුතුකර තිබෙනවාය. අමුතුකරනලද විකුණුම් කොන්දේසි අඩංගු ෆෝර්ම අමුතුකරනලද තැබෑරුම්වල ලැයිස්තුත් සමඟ මේ දිවයිනේ කවර කච්චේරියකින් නුමුත් ලබාගත හැකිය. මේ කොන්දේසි පිට විකුණන්නේ අරක්කු පමණක් බෙදා විකිණීමට බලය බවද රා විකුණන්ට බලයක් එහි ඇතුළත් නැති බවද සිතට ගතයුතුයි.

7. ඉංග්‍රීසි කථාකරන්ට නුපුළුවන් ඉල්ළුම්කාරයින්ට සභාවේ මහතුන් සමඟ කථාකරන්ට ඕනෑකරනොත් තෝල්ක වරුන් සමඟ එන්ට ඕනෑය.

8. යම් ඉල්ළුම්කාරයෙක් මන්ත්‍රණ සභාශාලාවට නොපැමිණ සිටියොත් නොහොත් ඔහු වෙනුවට ක්‍රියාකරන්ට බලය ලත් කෙනෙක් නොඑවා සිටියොත්ද, ඔහුගේ ටැන්ඩරයේ හැටියට එක මාසෙක රේන්ද මුදල වහාම බඳින්ට ලෑස්තිව නොසිටියොත්ද, ඔහුගේ ටැන්ඩර්පත්‍රය ගැන කල්පනාකරනු නොලැබේ.

9. ටැන්ඩර් ගැන කල්පනාකළායින් පසු ටැන්ඩර්කාරයින් දෙදෙනෙකු හෝ වැඩිදෙනෙකු අතරේ බද්ද ප්‍රසිඛ වෙන්දේසියේ විකුණන්ට නොහොත් අමුතු ටැන්ඩර් ඉල්ලන්ට කියා නියමකරන්ට සභාවට බලය තිබේ.

10. යම්කිසි ඉල්ලීමක් හෝ ටැන්ඩරයක් භාරගන්ට හෝ එපා කරන්ට සභාවට බලය තිබේ. තවද යම් ඉල්ලුම්කාරයකුගේ නොහොත් ටැන්ඩර්කාරයකුගේ භාරගනු ලැබේද ඔහු අයිතිවාසිය දෙනුලැබූ අය බව වහාම ප්‍රකාශකරනු ලැබේ. තවද ඒ අයිතිවාසිය දෙනුලැබුවේ යම් කොන්දේසි පිටද ඔහු විසින් ඒ කොන්දේසිවලට එකඟව ඒවා පිළිපැදිය යුතුයි.

11. තමන්ම ගොස් නොහොත් ලියමනක් යවා ගෞරවාර්හ ආදායම් කොන්ට්‍රෝලර්තුමාගෙන් ටැන්ඩර් ෆෝර්මකොළ නොමිලයේ ලබාගත හැකිය.

12. දැනගන්ට ඕනෑකරන වෙන යමක් ඇද්ද එය ඇක්සයිස් කොමසාරිස්තුමාගෙන් තමන්ම ගොස් අසා නොහොත් ලියමනක් යවා දැනගත හැකිය.

උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,

(අත්සන්කළේ), බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම් වම්සා.

වෂී 1920ක්වූ ජූනි මස 25වෙනි දින කොළඹ
මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

---

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම්.

වෂී 1920ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වෂී 1921 සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා මෙහි පහත සඳහන් වෙන මධ්‍යම දිසාවේ තොටුපල් රේන්ද මිලේට ගැනීම පිණිස දෙන්ට යෙදෙන "ටැන්ඩර්ස්" ඉල්ලුම්පත්‍ර වෂී 1920ක්වූ ජූලි මස 26වෙනි සඳුදින පස්වරු 2ට මහනුවර කච්චේරියේදී මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්ට යෙදෙන බව මෙයින් දැනුම්දෙමි.

භාරගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් යන් මුදලෙන් දහයෙන් කොටසක් සල්ලිවලින් වහාම මෙහි බැඳ තබන්ට ඕනෑය. එම ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින්

බාරගන්ට යෙදුනේවීනම්, ඔහුගේ ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් ඒත්තුගත් බව ඔහුට දැනුම්දුන් දින පටන් 30ස් දවසක් ඇතුළතදී එම ඉල්ලූ ගණනෙන් දෙකෙන් පංගුවක් වටිනා ඇප ඒත්තුගත් මුද්‍රඔප්පුවලින් හෝ තුනෙන් පංගුවකට වටිනා ඇප මුදලෙන් හෝ තිබා සම්පූර්ණකරන්ට ඕනෑය.

ඇප පිණිස තිබනලද ඔප්පු සෝදිසිකිරීමට සහ ඒවා ගැණ කල්පනාව දීමටත් ගෙවියයුතු ගාස්තුවද, ඒවා සෑදීමට සහ සෝදිසිකර සම්පූර්ණකිරීමටත් ආණ්ඩුවේ අද්වකාත් උන්නාන් සේට ගෙවියයුතු ගාස්තුද, ඉඩම් තක්සේරුකිරීමට සහ ඇප ඔප්පු රිජිස්ත්‍රකිරීමට ගෙවියයුතු ගාස්තුත් ඔහු විසින් ගෙවන්ට ඕනෑවා පමණකුත් නොව ඇප ඔප්පුවට වර්ෂ 1909ක්වූ අවුරුද්දේ නොම්මර 22කේ ආඥාපණතේ අන්දමට නියම මුද්දර ගාස්තුවත් ගෙවන්ට ඕනෑය.

ඇප වෙනුවෙන් තබනලද ඉඩම්වල ඔප්පු සියල්ලම මීට ප්‍රථම වෙන ඇපේකට නොහොත් උකසකට යටත් නැති බවට ඉඩම් ලියා පදිංචිකරණ රිජිස්ත්‍රාර්තැනාගෙන් සහතිකපත්‍රයක් සමග එවිය යුතුයි. මෙම සහතිකපත්‍රය ඇප තබන අයගේ වියදමෙන් ලබාගන්ට ඕනෑය.

මේ ගැණ වැඩිදුර කාරණ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ ගෙන් ඉල්ලුම්කළවිට දැනගත හැකිවේ.

විකිණීමට තිබෙන රේන්ද නම් :—

වේරගංතොට තොටුපල් රේන්දය.

සී. ඇස්. වෝන්.
මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1920ක්වූ ජූනි මස 25වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

---

පුත්තලමේ දකුණු ලුණු ඩිපෝ එකේ මූලාදෑනීන්ගේ සහ මුරකාරයින්ගෙත් ගෙවල් අළුත්වැඩියා කෙරීමට නොහොත් නැවත බැඳීමට ඉල්ලුම්පත්‍ර බාරගනු ලැබේ.

2. ඉල්ලුම්පත්‍රය සීල්කර වහපු ඇන්විලොප් එකක් තුළ දමා එවන්ට ඕනෑය. එම ඇන්විලොප් එක උඩ වම්පැත්තේ කොනෙන් මින් පහත සඳහන් වචන ලියා තිබෙන්ට ඕනෑය. එනම් :—"පුත්තලමේ දකුණු ලුණු ඩිපෝඑකේ මූලාදෑනීන්ගේ සහ මුරකාරයින්ගෙත් ගෙවල් අළුත්වැඩියා කෙරීමට නොහොත් නැවත බැඳීමට ඉල්ලුම්පත්‍රයයි." තවද එම ඉල්ලුම් පත්‍රය වර්ෂ 1920ක්වූ ජූලි මස 3වෙනි දින පස්වරු 1ට මත්තෙන් පුත්තලමේ ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේට ලැබෙන පිණිස එවන්ට ඕනෑය.

3. ඉල්ලුම්පත්‍රයේ පිටපතක් මතුකී වේලාවට මත්තෙන් කොළඹ "කොන්ට්‍රෝලර් ඔප් රෙවැනියු" උන්නාන්සේට ලැබෙන පිණිස සීල්කර වහපු ඇන්විලොප් එකක් තුළ දමා අරින්ට ඕනෑය.

4. ඉල්ලුම්කරන්ට අදහස්කරණ තැනැත්තා, ඔහුගේ ඉල්ලුම්පත්‍රය එවන්ට මත්තෙන් කොයිම කච්චේරියක හරි "ටැන්ඩර් පෝර්ම" යන ගණන යටතේ රුපියල් 10ක් බඳින්ට ඕනෑය. එසේ සල්ලි බැඳ ලබාගත් රිසිට්එක ඉල්ලුම්පත්‍රයට යාකර එවන්ට ඕනෑය.

5. ඉල්ලුම්කාරයෙකුගේ ඉල්ලුම්පත්‍රය බාරගත්කහි එකී ඉල්ලුම්කාරයා බාරගත් වැඩේ සතුටුදායක අන්දමකට කර දෙන හැටියට උප ඒජන්ත උන්නාන්සේ සමග පොරොන්දු පත්‍රයකට ඇතුල්වීම පිණිස එකී රුපියල් දහය ඇපයක් වශයෙන් තබාගන්ට යෙදේ. ඉල්ලුම්පත්‍රය බාරගෙණ, සෑහෙන කාලයක් ඇතුළතදී, එකී පොරොන්දු පත්‍රයට ඇතුල් නුණොත් එම ඇප මුදල රාජසන්තක කරණුලැබේ.

6. ඉල්ලුම්කාරයාට පුත්තලමේ ලියුම් ලැබෙන්ට නොහොත් බාරදෙන්ට පුළුවන්වෙන අන්දමට ඇඩ්‍රෙස් එකක් සඳහන් කරන්ට ඕනෑය.

7. මතුකී පොරොන්දුපත්‍රයට ඇතුල්වී, සුමාන හයක් ඇතුළතදී බාරගත් වැඩේකර ඉවරකරන්ට ඕනෑය.

8 වැඩිදුර කාරණ පුත්තලමේ ලුණු ඉන්ස්පැක්ටර් මහතාගෙන් අසා දැනගන්ට පුළුවන.

කරන්ට තිබෙන වැඩවල විස්තර.

වහලවල් නැවත අළුත් පොල්අතුවලිං සෙවිලිකර එහි මතු පිට බරව තිබීමට උමන් නොහොත් මාංගු දමන්ට ඕනෑය. ගෙම්දූලවල වැටවල් අළුත්වැඩියාකර වරිච්චි අතුරන්ට ඕනෑය.

2. ලුනු ස්ටෝර්කීපර්ගේ ප්‍රයෝජනය සඳහා අඩි 10×9ක් විසාල අළුත් කුස්සියක් සාදා බිත්ති මැටි ගසන්ට ඕනෑය. තවද එම නිලධාරීහුගේ බංගලාවේ සහ මුරකරන ගාර්ඩ්ගේ ගේ බිත්තිවල බැඳ තිබෙන හුබස් අහක්කර අළුත්වැඩියා කරන්ට ඕනෑය.

3. ලුනු ස්ටෝර්කීපර් පාවිච්චිකරන බංගලාවේ ගේ පද ලමේ උවමනාතැන් සිමෙන්තියෙන් අළුත්වැඩියාකෙරීමද, කක්කුස්සිය අළුත්වැඩියාකෙරීමද, කුස්සියේ දොරට අළුත් යතුරු තහඩුවක් සහ යතුරක්ද දමන්ට ඕනෑය.

4. පළමුවෙනි කොස්තාපල්ගේ ගෙදර කක්කුසිස්ය අළුත් වැඩියාකර පස්සහ දොරට පොල්ලක්ද දමන්ට ඕනෑය.

5. ලුනු සෝදිස්සිකාරයාගේ ගෙදර දොරක් අළුත්වැඩියා කරන්ට ඕනෑය.

6. දෙවෙනි කොස්තාපල්ගේ ගෙදර බිත්ති සුදුහුනු ගා දොරවල් සහ ජනේලවල තීන්ත ගාන්ට ඕනෑය.

7. වී. ඇම්. සිල්වාගේ ගෙදරට ජනේලයක්ද, අළුත් යතුරු තහඩුවක් සහ යතුරක්ද දමා බිත්තිවල සුදුහුනු ගාන්ට ඕනෑය.

8. බී. කුරුස්ගේ ගෙදර ගෙපදලම අළුත්වැඩියාකර ගොමගා අළුත් යතුරු තහඩුවක් සහ යතුරක් දමන්ට ඕනෑය.

ඩී. ඕ. පේ‍්‍රරා,
උප ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1920ක්වූ ජූනි මස 17වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

---

ලුණු දෙපාර්තමේන්තුවේ පළමුවෙනි කොස්තාපල්ගේ සහ මුරකරු දෙදෙනාගේත් කරතීවේ තිබෙන ගෙවල් අළුත් වැඩියාකිරීම සඳහා ඉල්ලුම්කාරයින් ඕනෑකර තිබේ.

2. ඉල්ලුම්පත්‍රවල "ලුණු දෙපාර්තමේන්තුවේ පළමුවෙනි කොස්තාපල්ගේ සහ මුරකරු දෙදෙනාගේ කරතීවේ තිබෙන ගෙවල් අළුත්වැඩියාකිරීම පිණිස ඉල්ලුම්පතයි" යන්න මුද්දර කරපු කවරවල වම්පැත්තේ ලියා තැබිය යුතුයි.

3. ඉල්ලුම්පත්‍ර වර්ෂ 1920ක්වූ ජූලි මස 3වෙනි දින පස්වරු 1කේ කනිසමට ප්‍රථම පුත්තලම උපඒජන්ත උන්නාන්සේට ලැබෙන ලෙස එවිය යුතුයි.

4. උපඒජන්ත උන්නාන්සේ වෙත ඉල්ලුම් ත්‍රය එවීමට ප්‍රථම ඉල්ලුම්කරන්ට අදහස්කර සිටින්නෙකු විසින් "ටැන්ඩර් පෝම්" යන වගන්තිය යටතේ රුපියල් 10ක් කොයියම්ම කච්චේරියක බැඳ ඊට එසේ මුදල් ලැබූ කච්චේරියෙන් දෙන රිසිට්එක අමුනා එවිය යුතුයි.

5. මෙම රුපියල් 10ය ඉල්ලුම්පත භාරගන්ට යෙදුනොත් වැඩය කෙරීම සඳහා උපඒජන්ත උන්නාන්සේ සමග බැඳිය යුතු කොන්ත්‍රාත්තුව ඇපයක්මෙන් භාරගනු ලැබේ. එසේ උපඒජන්ත උන්නාන්සේ විසින් නියමකල කාලයක් තුළ කොන්ත්‍රාත්තුවකට බැඳෙන්ට නොලැබුනොත් මෙම මුදල රාජසන්තක කරනු ලැබේ.

6. ඉල්ලුම්කාරයා විසින් ඔහුට ලියකියමන් ලැබෙන්ට පුළුවන් පුත්තලමේ ස්ථානයක් නියමකළ යුතුයි.

7. කොන්ත්‍රාත්තුවට බැඳුන දින සිට සුමාන 4ක් තුළ වැඩය අවසානකරන්ට ඕනෑය.

8. මේ සඳහා වැඩිමනත් කාරණා පුත්තලමේ ලුණු ඉන්ස්පැක්ටර්තැනගෙන් දැනගත හැකිය.

## කලයුතු වැඩේ විස්තර.

දැනට වහලේ තිබෙන්නාවූ අප්‍රයෝජන පොල්අතු සහ ලී අහක්කර අළුත්වා දැමිය යුතුයි.

සියලුම ප්‍රධාන ගෙවල් සහ යාවතිබෙන ගෙවල් අළුත් පොල් අතුවලින් සෙවිලිකර ඒ පියසි මතුපිට බරවීම පිණිස පුච්චූ තබන්ට ඕනෑය.

නිසි ස්ථානවල ගෙබිම මැටිදමා තලා සමතලාකර ගොම ගාන්ට ඕනෑය.

උවමනාකරන ස්ථානවල පලුදු හරිගස්සා බිත්ති සෑමතැනම සුදුහුනුගාන්ට ඕනෑය.

දොරවල් සහ ජනේලවල පලුදු හරිගස්සා තීන්තගාන්ට ඕනෑය. උවමනාකරණ යතුරු සහ තහඩුත් ගහන්ට ඕනෑය.

ගෙම්දුල් වටේ බැඳ තිබෙන්නාවූ වැටවල් සෑමතැනම අලුත්වැඩියාකරන්ට ඕනෑය.

පී. ඩී. පේ්‍රරා,
උපජ්ජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්‍ෂ 1920ක්වූ ජූනි මස 18වෙනි
දින පුත්තලම් කච්චේරියේදීය.

## සුප්‍රිම් උසාවියේ දැන්වීම්.

ශ්‍රී ලඞකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙසින් ප්‍රකාශ කරන්නේනම් බස්නාහිර දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්‍ෂ 1920ක්වූ ජූලි මස 12වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ අලුත්කඩේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසරඉල්ලා ලබාගෙන මිස එසින් පිටතට යන්ට නුසුළුවන් බවත් මෙසින් සෑමදෙනාටම දන්වන්නෙමි.

ඩබ්ලිව්. ද ලිවේරා,
පිස්කල් වෙනුවට.

වර්‍ෂ 1920ක්වූ ජූනි මස 14වෙනි දින
කොළඹ පිස්කල් කන්තෝරුවේදීය.

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙසින් ප්‍රකාශ කරන්නේනම් මඩකලපු දිසාවේ ක්‍රිමිනෙල් නඩුවිභාගය වර්‍ෂ 1920ක්වූ ජූලි මස 19වෙනි දින පෙරවරු 11 පැය පටන් මඩකලපුවේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එසින් පිටතට යන්ට නුසුළුවන් බවත් මෙසින් සෑමදෙනාටම දන්වන්නෙමි

ඒ. ආරියකුට්ටි,
පිස්කල්තුමා වෙනුවෙන්.

වර්‍ෂ 1920ක්වූ ජූනි මස 21වෙනි දින
මඩකලපුවේ පිස්කල් කන්තෝරුවේදීය.

H. R. COTTLE, ACTING GOVERNMENT PRINTER, COLOMBO, CEYLON